# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 165/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 28/01/2024<br>පැය 1940 |

# මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. වෙඩි තබා පුද්ගලයන් 05 දෙනෙකු ඝාතනය කිරීමේ අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - හක්මන පොලිස් ස්ථානය.**

2024.01.22 වන දින බෙලිඅත්ත පොලිස් වසමේ දී පුද්ගලයින් 05 දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවකු 2024.01.26 වන දින රත්ගම පොලිස් වසමේ දොඩන්දූව මාර්ගයේ දී හක්මන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඝාතනයට යොදා ගත් ටී 56 වර්ගයේ ගිණි අවි 02ක් සැකකරු විසින් මෙම අපරාධයේ ප්‍රධාන සැකකරුගෙන් ලබා ගෙන යතුරු පැදියකින් අකුරැස්ස ප්‍රදේශයේ සිට කරාපිටිය ප්‍රදේශයට ප්‍රවාහනය කර ඇත. එම අවි බැහැර කිරීමට යොදා ගත් යතුරු පැදිය හා සැකකරු භාවිතා කල ජංගම දුරකථන 02 ක් පොලිස් භාරයට ගෙන ඇති අතර, සැකකරු වැඩිදුර විමර්ශන සඳහා බෙලිඅත්ත පොලිස් ස්ථානයට භාර දී ඇත.

සැකකරුට දින 07 ක රැඳවුම් නියෝග ලබා ගෙන බෙලිඅත්ත පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයන් සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2023.12.31 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඝාතනය කර පලා යාමේ සිද්ධිය සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මෙම ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවෙකු 2024.01.27 වන දින රාත්‍රී කාලයේ පර්ගියුෂන් පාර ප්‍රදේශයේ දී යතුරු පැදියක්ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ කඹුරුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිදු කල විමර්ශනයේදී මෙම සැකකරු වෙඩි තැබීමට පැමිණි යතුරු පැදියේ පැදිකරු වශයෙන් කටයුතු කර ඇති බවත්, පොලිස් භාරයට ගත් යතුරු පැදිය සොරකම් කරන ලද යතුරු පැදියක් බවට හා වෙඩි තැබීමට යොදා ගත් ගිණි අවිය වැල්ලම්පිටිය ප්‍රදේශයේ පුද්ගලයෙකුට ලබා දී ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව 2024.01.27 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය වෙලේවත්ත ප්‍රදේශයේදී එම ගිනි අවිය ලබා ගත් පුද්ගලයාද මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දීම හා බලපත්‍ර නොමැතිව ගිනි අවියක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් **පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් ගැබක්, සජීව පතරොම් 03 ක් හා ජංගම දුරකථනයක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 22 ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. පොලිස් නිලධාරීන් බවට ව්‍යාජව පෙනී සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බිංගිරිය පොලිස් ස්ථානය.

2024.01.26 වන දින බිංගිරිය පොලිස් වසමේ පඩිවෙල ප්‍රදේශයේ දී රුපියල් 930,000/- ක් වටිනා ත්‍රීරෝද රථයක් කොල්ලකෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් බිංගිරිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කරන ලදි.

මේ සම්බන්ධව සිදු කරන ලද විමර්ශනයේදී ඉහත පැමිණිලිකරු 2024.01.25 වන දින මුදල් ඔට්ටුවට සූදු සෙල්ලම් කිරීමට ගොස් ත්‍රීරෝද රථය රුපියල් 30,000/= ක මුදලකට කාන්තාවකට උකස් කර ඇති බවට අනාවරණය වී ඇත. ත්‍රීරෝද රථය උකස් තැබීම සම්බන්ධයෙන් නිවැසියන්ට වසන් කිරීම සඳහා පැමිණිලිකරු විසින් උකස්කාරියට දන්වා තවත් පුද්ගලයින් දෙදෙනෙකු සමඟ සම්බන්ධ වී ත්‍රීරෝද රථය නිවස ආසන්නයට රැගෙන පැමිණ නිවැසියන්ට එම ස්ථානයට පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුම් දී ඇත. ඒ අනුව නිවැසියන් පැමිණි පසු පැමිණිලිකරු සමඟ පැමිණි පුද්ගලයින් දෙදෙනා ඔවුන් පොලිස් නිලධාරීන් බවට හඟවමින් රියදුරු බලපත්‍රයේ අඩුපාඩුවක් හේතුවෙන් ත්‍රීරෝද රථය පොලිස් ස්ථානයට රැගෙන යන බවට පැමිණිලිකරුගේ නිවැසියන්ට දැනුම් දී ත්‍රීරෝද රථය රැගෙන ගොස් උකසට ලබා ගත් කාන්තාවට ලබා දී ඇත.

ඒ අනුව 2024.01.27 දින ඉහත පොලිස් නිලධාරීන් බවට වංචනිකව පෙනී සිටි පුද්ගලයින් දෙදෙනා බිංගිරිය පොලිස් වසමේ මෙලදෙණිය ප්‍රදේශයේ දී ත්‍රීරෝද රථය ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 31 වයස් වල පසු වන උඩවෙල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම අසත්‍ය පැමිණිල්ල සිදු කල පුද්ගලයාට එරෙහිව ඉදිරි නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා බිංගිරිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.